ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර — තනතුරු සංඛ්‍යාව : 10

සේවා ගණය : **MA 1-1**

## තනතුරෙහි ස්වභාවය

- ලේඛන කළමනාකරණ සහ ලේඛනාගාර කටයුතු සඳහා සහාය වීම
- සාමාන්‍ය පරිපාලන සහ කාර්යාලීය කටයුතු සඳහා සහාය වීම
- කාර්ය මණ්ඩල සහ මානව සම්පත් කටයුතු සඳහා සහාය වීම
- මූල්‍ය, අභ්‍යන්තර විගණන සහ ගිණුම්කරණ කටයුතු සඳහා සහාය වීම
- දත්ත පද්ධති, තොරතුරු තාක්ෂණ සහ ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා සහාය වීම
- භාණ්ඩ පාලනය සහ ගබඩා කළමනාකරණය සඳහා සහාය වීම
- අධ්‍යක්ෂ ජනරාල්, මාණ්ඩලික නිලධාරීන් හා පරිපාලන නිලධාරීන් පවරන වෙනත් රාජකාරී

## සුදුසුකම් (පහත 1 හෝ 2)

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

- **i.** සිංහල/ දෙමළ
- **ii.** ගණිතය
- **iii.** ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර **(04)** කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය **(06)** කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන **(03)** ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්:-

- පරිගණක යෙදුම් භාවිතය පිළිබඳව මාස තුන **(03)** තුනකට නොඅඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

## වයස් සීමාව

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය.

---

## වැටුප් පරිමාණය

**MA 1-1 - 2025 - රු. (46,220 - 10 x 540 - 7 x 630 - 4 x 890 - 20 x 1,190 - 83,390)**

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED